**ඇලෙයිනා බීටෙප්ලිට්ස් තානාපතිතුමිය . සමගින් CSST සිදුකළ සම්මුඛ සාකච්ඡාව**

*1.) ශ්‍රී ලංකාවේ වත්මන් දේශපාලන තත්වය එක්සත් ජනපදයට අභියෝගයක් ලෙස දැකිය හැකිද? මේ ප්‍රශ්නය ඇසීමට හේතුවක් තිබෙනවා. බටහිර-හිතකාමී පක්ෂයක් වන එක්සත් ජාතික පක්ෂය (UNP) ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ බරපතළ ලෙස පරාජිත තත්වයකට පත් වී තිබෙනවා. එක්සත් ජාතික පක්ෂය ජාත්‍යන්තර ගතානුගතික දේශපාලන පක්ෂ සමූහයක් වන ජාත්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදී සංගමයේ (International Democrat Union ) සාමාජිකයකු වන බැවින් බටහිර රටවල් සමග ශ්‍රී ලංකාවේ සම්බන්ධතාවය නිර්වචනය කිරීමේ දීර්ඝකාලීන සම්ප්‍රදායක් ඊට තිබෙනවා. කෙසේනමුත්, මෙම පක්ෂය දැනට පිරිහෙමින් පවතිනවා. මෙවන් පසුබිමක් තුළ, එක්සත් ජනපද-ශ්‍රී ලංකා සම්බන්ධතාවය අර්බුදයක පවතින බවක් විස්තර කළ හැකිද? මේ පිළිබඳ ඔබේ නිරීක්ෂණ මොනවාද?*

එක්සත් ජනපදයේ සහ ශ්‍රී ලංකාවේ සම්බන්ධතාවය ගොඩනැගී ඇත්තේ අපට පොදු ප්‍රජාතන්ත්‍රවාදී සාර්ධර්ම සහ ශ්‍රී ලංකාව හැකිතාක් සමෘද්ධිමත් සහ ආරක්ෂිත තත්වයකට ගෙන ඒම සඳහා අපේ ඇති පොදු කැපවීම මතයි- එමෙන්ම, සමුද්‍ර ආරක්ෂාව, පරිසර සංරක්ෂණය, සහ සයිබර් අවකාශයේ ආරක්ෂාව වැනි වැදගත් ගැටළු සම්බන්ධයෙන් අපේ ඇති සහයෝගීතාවයෙන් එය තවත් ශක්තිමත් කරනවා. විවිධ දේශපාලන ස්ථාවර සහිත ශ්‍රී ලාංකිකයින් සමගින් අපි යහපත් සම්බන්ධතා පවත්වන අතර ශ්‍රී ලංකාවේ විවිධ පසුබිම්වලට අයත් පුද්ගලයින් සමගින් හවුල්කාරීත්වය සහ සංවාදය අප අගය කරනවා.

ඕනෑම සම්බන්ධතාවයකදී මෙන්ම මෙහිදීත්, අපට බැඳීම් ශක්තිමත් කරගැනීමටත් අවබෝධය වර්ධනය කරගැනීමටත් තව බොහෝදේ කළ හැකියි. අපේ ශ්‍රී ලාංකික හවුල්කරුවන් සමගින් විවෘත සන්නිවේදන මාර්ග පවත්වාගැනීම වැදගත්වන්නේ මේ නිසායි, එවිට අප එකිනෙකට වෙනස් මත දරන අවස්ථාවලදී අපට එක් වී වැඩ කර එකිනෙකාව අවබෝධ කරගැනීමටත් විසඳුම් සොයාගැනීමටත් හැකියි.

අපි ශ්‍රී ලංකාවට ලබාදෙන විදේශ ආධාර මූලික වශයෙන්ම පක්ෂවාදී නැහැ. සියළුම ශ්‍රී ලාංකිකයින්ගේ අවශ්‍යතා සපුරාලන සමෘද්ධිමත් රටක් සංවර්ධනය කිරීම සඳහා අප ශ්‍රී ලංකා රජයට උදවු කිරීමට උත්සාහ දරනවා. උදාහරණ වශයෙන්, ගරු මහින්ද යාපා අබේවර්ධන කථානායකතුමාගේ සභාපතිත්වය ඇති උපදේශක කමිටුවක් හරහා අපි ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට උපකාර කරනවා. මේ ලබාදෙන සහය හරහා වෘත්තීමය පාර්ලිමේන්තු කාර්යමණ්ඩලයට වාගේම සියළුම පක්ෂවල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහය ලබාදෙන අතර, ඒ ඔස්සේ සියළුම ශ්‍රී ලාංකිකයින්ගේ අවශ්‍යතා සපුරාලීම පිළිබඳ ආමන්ත්‍රණය කිරීමට අප පාර්ලිමේන්තුවට උදවු කරනවා.

ආබාධිත තැනැත්තන් සඳහා වන මුලපිරීම්, කාන්තා අයිතිවාසිකම්, සේවාස්ථානයේ ලිංගික හිරිහැර වැලැක්වීම, මෙන්ම ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) ප්‍රඥප්ති අංක 190 (C190) අපරානුමත කිරීම යනාදිය සම්බන්ධයෙන් ජාතික මට්ටමින් ප්‍රතිපත්ති සංවාද සිදුකිරීම සඳහා 9වැනි පාර්ලිමේන්තුවේ කාන්තා සංසදයට (WPC) ලබාදෙන තාක්ෂණික සහය, අප විසින් ලබාදෙන පක්ෂවාදී-නොවන උපකාර සඳහා තවත් උදාහරණයක්. එක්සත් ජනපද සහය හරහා පාර්ලිමේන්තුවේ කාන්තා සංසදය සහ කාන්තාවන් පිළිබඳ විශේෂ කාරක සභාව තමන් පාර්ලිමේන්තුවට සිදුකරන ව්‍යවස්ථාදායක නිර්දේශ වඩාත් ඔපමට්ටම් කරගැනීමට සාක්ෂි-පදනම් කරගත් ප්‍රතිපත්ති විවාද සිදුකරනු ලැබුවා.

ඒ වාගෙම අපි පාලනයේ සෑම මට්ටමකදීම ස්ත්‍රීපුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් සැලකිලිමත්භාවය දිරිගැන්වීම සඳහා තාක්ෂණික සහ ආයතනික සහය ලබාදෙනවා. ස්ත්‍රීපුරුෂ සමාජභාව ප්‍රතිචාරී අයවැයකරණ (GRB) මාර්ගෝපදේශ, කාර්යසාධන දර්ශක, සහ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ස්ත්‍රීපුරුෂ සමාජභාවය මුලප්‍රවාහගත කිරීමේ අත්පොතට GRB සම්බන්ධයෙන් පරිච්ඡේදයක් සකස් කරගැනීම හරහා රටේ සැලසුම් සහ සම්පත් වෙන්කිරීම සාධාරණත්ව සහ සර්වග්‍රාහී කාචයකින් සිදුකිරීමට අපි ශ්‍රී ලංකාවට උපකාර කරනවා. දේශපාලන ක්‍රියාවලි මෙන්ම ආර්ථික තුළ ප්‍රබල කාන්තා සහභාගීත්වයක් ප්‍රවර්ධනය කරන රටවල් වඩාත් සාධාරණ සමාජ වනවා

පමණක් නොවේ, එවැනි සමාජ වඩාත් සමෘද්ධිමත් වනවා. රටේ ආර්ථිකය ඉදිරියට ධාවනය කරමින් පොදු සමෘද්ධිමත්භාවය ප්‍රවර්ධනය කරන්නා වූ මෙවැනි මුලපිරීම් දිරිගැන්වීම සඳහා අපේ ශ්‍රී ලාංකික හවුල්කරුවන් සමගින් ඉදිරියටත් වැඩ කිරීමට අපි උනන්දුවෙන් බලාපොරොත්තු වෙනවා.

*2.) 2018 කළ ප්‍රකාශයේදී ඔබ මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ සාර්ථකත්වය මෙරටට එක්සත් ජනපදයට වඩාත් ශක්තිමත් හවුල්කරුවකු වීමට සහ නිදහස් හා විවෘත ඉන්දු ශාන්තිකරයක් සඳහා අපට ඇති පොදු දැක්මට දායකවීමට හේතුවනු ඇති බව සඳහන් කළා. ශ්‍රී ලංකාවේ වත්මන් රජය විදේශ සබඳතාවලදී තමන් මධ්‍යස්ථ බව පවසනවා. මේ පසුබිම තුළ, සහ අනෙක් අතට, චීනය නිදහස් හා විවෘත ඉන්දු ශාන්තිකර දැක්මට දැඩි සේ විරුද්ධ වන නිසා, නිදහස් හා විවෘත ඉන්දු ශාන්තිකරයක් සඳහා වන දැක්මේ ශක්තිමත් හවුල්කරුවකුවීම ශ්‍රී ලංකාවට අභියෝගයක් නොවේවිද? මෑතකදී, එක්සත් ජනපද නායකත්වය සහිත Quad සන්ධානයට බැඳීමට එරෙහිව බංග්ලාදේශයට අනතුරු ඇඟවීමටත්, එය 'පටු අරමුණු සහිත' සන්ධානයක් බව කීමටත් චීනය කටයුතු කර තිබුණා. මේ පසුබිම තුළ , මධ්‍යස්ථ ප්‍රතිපත්තියක් සහිතව ශ්‍රී ලංකාවට නිදහස් හා විවෘත ඉන්දු ශාන්තිකරයක් සඳහා වන දැක්මේ ශක්තිමත් හවුල්කරුවකු වන්නට හැකියි කියා ඔබ සිතනවාද?*

මුලින්ම Quad යනු කුමක්ද කියා පැහැදිලි කර දෙමින් මා ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්නම්. ප්‍රායෝගික සහයෝගීතාවය හරහා ප්‍රතිඵල ලබාදීමට කැපවූ ජාතීන් හතරක්, එනම් ඔස්ට්‍රේලියාව, ඉන්දියාව, ජපානය සහ එක්සත් ජනපදය මෙම කලාපයේ සැහෙන විනාශයක් සිදුකළ 2004 දෙසැම්බර් සුනාමි උවදුරෙන් පසුව එකට එක්වී කඩිනම් මානුෂීය ආධාර සහ ආපදා සහන ලබාදීම සඳහා කටයුතු කළා. Quad නමින් හඳුන්වන මේ සහයෝගීතාවය අර්බුද අවස්ථාවක ඇතිවී, නිදහස්, විවෘත, ඔරොත්තුදෙන සහ සර්වග්‍රාහී ඉන්දු ශාන්තිකර කලාපයක් සඳහා වන පොදු දැක්මක් වෙනුවෙන් සිදුකෙරෙන රාජ්‍යතාන්ත්‍රික සංවාදයක් සහ කැපවීමක් බවට විකාශය වූවා.

නිදහස්, විවෘත, ඔරොත්තු දෙන, සහ සර්වග්‍රාහී ඉන්දු ශාන්තිකරයක් සඳහා වන දැක්මක් බෙදාහදාගැනීමට එක්සත් ජනපදයට සහ ශ්‍රී ලංකාවට කිසි අභියෝගයක් ඇති බවක් මා සිතන්නේ නැහැ. මේ පොදු දැක්ම ඇත්තේ සියළු රටවල ස්ථායිතාවය, සමෘද්ධිමත්බව සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මූලික වන පුළුල් වටිනාකම් සහ මූලධර්ම ආරක්ෂා කරගැනීම සම්බන්ධවයි. සමුද්‍ර තරණයේ නිදහස හා ආරවුල් සාමකාමී ලෙස විසඳා ගැනීම; සාධාරණ, විනිවිදභාවයෙන් යුත් සහ සර්වග්‍රාහී ආර්ථික ප්‍රතිපත්ති; සහ යහපාලනය හා නීතියේ ආධිපත්‍යට කැපවීම එම මූලධර්ම අතරට ඇතුළත් වනවා.

මේ ප්‍රතිපත්ති හරිම පුළුල්, එනිසා අපි ශ්‍රී ලංකාවේ දෘෂ්ටිකෝණයෙන් මේ දෙස බලමු. ශ්‍රී ලංකාව පිහිටා තිබෙන්නේ ඉන්දියානු සාගරයේ කාර්යබහුලම මුහුදු මාර්ගය ආසන්නයේ. ලෝකයේ බහාළුම් නැව් අතරින් භාගයක් පමණ, ලෝකයේ තොග භාණ්ඩ ප්‍රවාහනයෙන් තුනෙන් එකක් සහ ලෝකයේ තෙල් නැව් අතරින් තුනෙන් දෙකක් මේ මාර්ගයේ ගමන් කරනවා. නාවික කටයුතු සමුද්‍ර තරණයේ නිදහස මත රැඳී තිබෙනවා. එය නොමැතිවුවහොත් ශ්‍රී ලංකාවට තමන්ගේ භූක්‍රමෝපායික පිහිටීමෙන් සහ වරාය සඳහා කළ ආයෝජනවලින් පූර්ණ වශයෙන් ඵල නෙලාගන්නට නොහැකි වනවා. ඔබ දන්නා පරිදි, තනි රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ විශාලතම අපනයන වෙළඳපල වන එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ වඩාත්ම වැදගත් ආර්ථික හවුල්කරුවකු වනවා. සමුද්‍ර තරණයේ නිදහස නොමැතිව මෙය ද සිදුකළ නොහැකි දෙයක් වනවා.

සමුද්‍රයේ නීති සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ විශේෂ ආර්ථික කලාපය (EEZ) සාගර සම්පත්වලින් පිරී තිබෙනවා. එනිසාම සමුද්‍රීය පරිසර පද්ධතිවලට, ආහාර සුරක්ෂිතභාවයට සහ ජීවනෝපායට තර්ජනයක් වන ආකාරයෙන් එම කලාපය නීති විරෝධී, වාර්තා නොකළ, සහ නියාමනයකින් තොර (IUU) ධීවර කටයුතුවලට ඉලක්කයක් වෙනවා. නීති විරෝධී ලෙස අල්ලා ගත් මත්ස්‍යයින් ගෝලීය වෙළඳපලට ඇතුළත් කිරීම වැලැක්වීමට එක්වී වැඩකිරීම සඳහා එක්සත් ජනපදයත් ශ්‍රී ලංකාවත් කැපවී සිටින්නේ මෙනිසායි.

කෙසෙනමුත්, ශ්‍රී ලංකාව පිහිටා ඇති ස්ථානය හේතුවෙන් මෙරටට පුද්ගලයින්, අවි සහ මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම වැනි රාජ්‍ය දේශසීමා ඉක්මවා යන අපරාධවලටත් මුහුණදීමට සිදුවී තිබෙනවා. සමුද්‍රීය

ආරක්ෂාව එක්සත් ජනපදයටත් ශ්‍රී ලංකාවටත් පොදු ක්‍රමෝපායික කරුණක් බවට පත් වී තිබෙන්නේත්, මුර සංචාර සහ තහනම් භාණ්ඩ අල්ලාගැනීම් ඇතුළු ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ ගුවන් හමුදාවේ සමුද්‍රීය ශක්‍යතා වැඩිදියුණු කිරීමට එක්සත් ජනපදය ශ්‍රී ලංකාවත් සමගින් හවුල්වන්නේත් මෙනිසායි. මේ හවුල්කාරීත්වය හරහා, සහ එක්සත් ජනපදයෙන් ශ්‍රී ලංකාවට පරිත්‍යාග කර ඇති නෞකා සමගින් 2020 මාර්තු මාසයේ දී එසේ ඉතිහාසයේ කළ විශාලතම මත් ද්‍රව්‍ය අල්ලාගැනීමක් සිදුකිරීමට ශ්‍රී ලංකාවට හැකිවුනා.

පැහැදිලිව කියනවා නම්, ඉන්දු ශාන්තිකරය සඳහා අපේ පොදු දැක්ම සාමාජිකත්වය හෝ දේශපාලන පෙළගැස්ම මගින් නිර්වචනය වන්නේ හෝ සීමා වන්නේ නැහැ. ඒ වෙනුවට, එය ලෝකයේ මේ විශාල කලාපය ආරක්ෂිත සහ සමෘද්ධිමත් වන බව සහ ආරවුල් සාමකාමීව විසඳාගැනීම, සහ විනිවිදභාවයෙන් යුත් සාධාරණ හා විවෘත වෙළඳාම හා තරඟකාරීත්වය සඳහා ගරුකරණ බව සහතික කරගන්නට දරන වෑයමක් වනවා.

රාජපක්ෂ ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ මේ මූලධර්ම සඳහා පක්ෂව කථාකරන අතර ජාත්‍යන්තර සම්මත සමගින් වඩාත් හොඳින් සමපාතවීම සඳහා යල්පිනූ නීති කාර්යපටිපාටි සහ නීති ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරනවා. එමෙන්ම, එම ප්‍රතිපත්ති ප්‍රකාශයේ ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේදී විනිවිදභාවය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරන අතර ශක්තිමත් පෞද්ගලික අංශයක් සහ ව්‍යාපාර පරිසරයක් නිර්මාණය කිරීමේ වැදගත්කම පිළිබඳව එහි සඳහන් වනවා. මේ සියල්ල එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව යන දෙරටටම පොදු ඉලක්ක වන අතර, එම අන්‍යොන්‍ය අරමුණු පදනම් කරගෙන කටයුතු කරන්නට අපි උනන්දුවෙන් බලාපොරොත්තු වනවා.

*3) ශ්‍රී ලංකාවේ සිදුකෙරෙන චීන ආයෝජන ව්‍යාපෘති සම්බන්ධයෙන් පුළුල් ලෙස විවේචන එල්ල වී තිබෙනවා. නමුත් චීන තානාපතිවරයා කොළඹවරාය නගරය ව්‍යාපෘතිය සහ හම්බන්තොට වරාය ව්‍යාපෘතිය විස්තර කරන්නේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයේ ද්විත්ව එන්ජින් වශයෙනුයි. නමුත් මෙම වරාය නගරය තුළින් මුදල් විශුද්ධිකරණය කරන්නන්ට සහ වෙනත් අනිසි කටයුතුවල නිරතවන්නන්ට වාසි ලබාගතහැකි තත්වයන් නිර්මාණය වීමට ඉඩ ඇති බවට ඔබ අනතුරු ඇඟවූවා. අනෙක් අතට රජය ද මේ වරාය නගරය ආර්ථිකය ගලවාගත හැකි ව්‍යාපෘතියක් වශයෙන් දකින බවක් පෙනෙන්නට තිබෙනවා. බටහිර රටවලට, විශේෂයෙන්ම එක්සත් ජනපද ආයෝජකයින්ට මේ තත්වය යටතේ වරාය නගරයේ ආයෝජන සිදුකරන්නට අවස්ථා තිබෙනවාද?*

වරාය නගරය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ සම්මත වූ නීතියේ ඇතැම් අංග සම්බන්ධයෙන් තවදුරටත් එක්සත් ජනපදය සැලකිල්ල දක්වනවා. දූෂිත බලපෑම් සහ නීතිවිරෝධී මූල්‍යකරණය, මුදල් විශුද්ධිකරණය, සහ/ හෝ නීති විරෝධී ක්‍රියා සඳහා ඉඩක් ඇති පරිසරයක් මෙන් ඔවුන් දකින තත්වයකින් වාසි ලබාගැනීමට කැමති අයුතු ක්‍රියාකාරීන් විසින් සිදුකරන වෙනත් ක්‍රියා සඳහා විවෘත තැන් පවතින බවක් පෙනෙන්නට තිබෙනවා. එක්සත් ජනපද සමාගම් ඒ ගැන සැලකිලිමත් වෙනු ඇති.

ශ්‍රී ලංකාවේ ආයෝජන කිරීමට සලකාබලන එක්සත් ජනපද සමාගම්වලට වුවමනා කරන්නේ පුරෝකථනය කළහැකිබව සහ ආයෝජන පරිසරය ගැන පැහැදිලි අවබෝධයකුයි. ඔවුන් මෙරට ආයෝජනය කරනවා නම්, නියාමන ආයතනවලින් හෝ තමන්ගේම කොටස් හිමිකරුවන්ගෙන් හෝ අධ්‍යක්ෂ මණ්ඩලවලින් ඔවුන්ට ප්‍රශ්න ඇතිවිය හැකි අන්දමේ අවදානම්වලට ඔවුන්ට මුහුණ දෙන්නට සිදුනොවන බව දැනගැනීමට ඔවුන්ට වුවමනා වේවි. විදේශ දූෂිත ව්‍යවහාර පනත (FCPA) යටතේ, ඕනෑම එක්සත් ජනපද ව්‍යාපාරයක් හෝ පුරවැසියෙක් යම් ව්‍යාපාරයක් ලබාගැනීම හෝ පවත්වාගැනීම සඳහා ඕනෑම විදේශ නිලධාරියකුට මුදල් හෝ වටිනාකමින් යුත් කවර හෝ දෙයක් ගෙවීමට ඉදිරිපත්වීම, ගෙවීම, හෝ ගෙවීමට පොරොන්දුවීම නීති විරෝධී වනවා. ශ්‍රී ලංකාවේ ආයෝජන කිරීමට සලකා බලන එක්සත් ජනපද සමාගමකට, එක්සත් ජනපද භාණ්ඩාගාරයෙන් හෝ වාණිජ දෙපාර්තමේන්තුවෙන් ආර්ථික ක්‍රියාමාර්ග පනවනු ලැබීමකට ලක් වියහැකි යම් ව්‍යාපාර හෝ පුද්ගලයින් වෙත තමන් නිරාවරණයවීම හෝ එවැනි අය සමගින් සහයෝගයෙන් වැඩකිරීම සිදු නොවනු ඇතැයි විශ්වාසයක් තිබිය යුතුයි.

වරාය නගර ව්‍යාපෘතියට දැනටමත් කර ඇති ආයෝජනවලින් ඵල නෙලාගැනීමට ශ්‍රී ලංකාවේ රජයට වුවමනා බව අපි පිළිගන්නවා, එය තේරුම්ගතහැකි කරුණක්. සරළවම අප කල්තබා අවදානම පිළිබඳව දැනුම්දීමක් කරන්නේ මෙවැනි විශාල යටිතල පහසුකම්/ සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා නීති සහ රෙගුලාසි නිවැරදිව සම්පාදන කරගැනීම සහ නීති විරෝධී ක්‍රියාකාරකම් සහ අසාධාරණ තරඟකාරීත්වය සඳහා දොරටු විවෘත කර නොතැබෙන බව සහතික කරගැනීම වැදගත් වන නිසායි. පොදුවේ ප්‍රතිපත්තියක් වශයෙන්, අයහපත් මුදල් මගින්- එනම් මුදල් විශුද්ධිකරණය සඳහා ඇති ඉඩකඩ නීතියෙන් වසා නොදැමුවහොත්, එමගින්- යහපත් මුදල් පලවා හරිනවා.

"ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයේ ද්විත්ව එන්ජින් " පිළිබඳ ඔබ සඳහන් කළා. මා හිතන හැටියට, වඩාත් වැදගත් ප්‍රශ්නය නම් "මේ එන්ජින් ශ්‍රී ලංකාව ගෙනයනු ඇත්තේ කොතැනකටද?" යන ප්‍රශ්නයයි. හම්බන්තොට වරාය ව්‍යාපෘතිය හේතුවෙන් රටට විශාල ණය බරක් දරන්නට සිදුවූවා, අවසානයේදී ශ්‍රී ලංකාවට සිදුවූයේ ඉදිරි අවුරුදු සියයක් දක්වා එම වරාය බදුදීමටයි. කොළඹ වරාය නගරය සැකසහිත ආර්ථික ව්‍යවහාර සහ දූෂණය සම්බන්ධ විවිධ කාරණා සඳහා ශ්‍රී ලංකාව නිරාවරණය කරන්නට ඉඩ තිබෙනවා. ඉන් ඵලප්‍රයෝජන ලබන්නේ කවුද? ඉන් යම් අයුතු ක්‍රියාකාරීන් වාසි ලබාගනු ඇතත් පොදුවේ ශ්‍රී ලාංකීය ආර්ථිකය ඉන් පීඩාවට පත්වේවි. රටේ ජනතාවට ප්‍රතිලාභයක් ලැබීමට නම් එරට ආයෝජනවලින් ධනාත්මක ප්‍රතිඵලයක් උත්පාදනය විය යුතුයි. රැකියා, ආදායම හෝ කීර්තිනාමය අවදානමට හෙළීම යනාදී කවරාකාරයකින් හෝ සෘණාත්මක ප්‍රතිඵලයක් ගෙනදෙන ආයෝජන රටේ අනාගත ආර්ථික වර්ධනයට බරපතල බාධාවක් වනු ඇති.

ආර්ථික වශයෙන් ශක්තිමත් සහ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් අප දෙරටේම යහපතට හේතු වෙනවා. ගෝලීය ආර්ථිකය ඉදිරියට ධාවනයේදී පෞද්ගලික අංශය ප්‍රධාන භූමිකාවක් නිරූපණය කරනවා. ඉහළ ගුණාත්මකබවකින් යුත් එ.ජ. පුද්ගලික ආයෝජන ආකර්ෂණය කරගැනීමටත්, මේ කලාපයේ සිටින ආකර්ෂණශීලී සහ විශ්වසනීය ආර්ථික හවුල්කරුවකු වශයෙන් ශ්‍රී ලංකාවේ ස්ථාවරය තහවුරු කරගැනීමටත් මෙරට නිසි තත්වයන් පවතින බව සහතික කරගැනීම රජයේ ප්‍රධානතම ප්‍රතිපත්ති ඉලක්කයක් වියයුතුයි.

*4) මෑතකාලීනව උතුරු-නැගෙනහිර ආයෝජන සිදුකිරීමට චීනය උනන්දුවන බවක් පෙනෙන්නට තිබෙනවා. නමුත් දෙමළ ජනතාවගේ ප්‍රධාන දේශපාලන නායකයින් වන දෙමළ ජාතික සන්ධානය (TNA) මීට දැඩි ලෙස විරුද්ධ වනවා. දෙමළ ජාතික සන්ධානය මෙසේ කියන්නේ ඉන්දියාව සහ එක්සත් ජනපදය සතුටු කිරීමට යැයි මතයක් තිබෙනවා. එමෙන්ම, ශ්‍රී ලංකාවට දැඩි ආර්ථික අවශ්‍යතා පවතින නිසා යම් සීමාවකින් ඔබ්බට ආයෝජන ව්‍යාපෘති ප්‍රතික්ෂේප කිරීමට නොහැකිය යන යථාර්ථයකුත් තිබෙනවා. චීනයේ ආයෝජන සම්බන්ධයෙන් එක්සත් ජනපදයේ පොදු නිරීක්ෂණය කුමක්ද?*

හොඳ ආයෝජනයක් කියන්නේ ආර්ථික ප්‍රතිලාභයක් ලබාදෙන, රැකියා උපදවන සහ ණය ගැනීම අවශ්‍ය වන්නේ නම් එහිදී රටට කළමනාකරණය කරගත හැකි ණයබරක් ඉතිරි කරන ආයෝජනවලටයි. වෙනත් රටක් ශ්‍රී ලංකාවේ ආයෝජනය කරද්දී සෑම ශ්‍රී ලාංකිකයකුම මේ වැදගත් ප්‍රශ්න ගැන සලකාබැලියයුතුයි. එමගින් පොරොන්දු වූ ප්‍රතිලාභ උපදවනවාද? එනිසා දරන්නට වන ණය බර අනුව මෙය වටිනවාද? ආයෝජනයේ සමස්ථ ගුණාත්මකබව කුමක්ද?

නිෂ්පාදන අංශයේ, නිපැයුම් නවෝත්පාදනයේ සහ සැපයුම් දාමවල සිදුකර ඇති බොහෝ යහපත් ආයෝජන හරහා එක්සත් ජනපදය සහ ශ්‍රී ලාංකීය සමාගම් එක්ව වැඩ කරමින් ඉහළ ගුණාත්මකබවකින් යුත් භාණ්ඩ නිර්මාණය කරනවා. මේ සම්බන්ධතා තුළින් ශ්‍රී ලාංකිකයින්ට රැකියා උත්පාදනය වන අතර සහයෝගිතාවයේ එම බැඳීම සමගින් අප දෙපාර්ශවයෙන් කාහට හෝ තනිව කරගත නොහැකි මට්ටමකට අපේ ප්‍රමිතීන් ඉහළ නංවාගැනීමට හැකි වී තිබෙනවා. එහි ප්‍රතිඵලය ඒ නිපැයුම් තුළින්ම දකින්නට පුළුවන්- ඉස්තරම් රුවල්, බිලී කොකු, ඇඟළුම්, සහ සාගර තාක්ෂණයන් පමණක් නොව ලෝකයේ අනෙක් අයගේ භාවිතය සඳහා ශ්‍රී ලාංකිකයින් විසින් ශ්‍රී ලංකාවේම නිපදවන මෘදුකාංග ඒ සඳහා උදාහරණ වනවා. මේ ව්‍යාපාර සබඳතා නිසා අප දෙරට අතරේ නිරන්තරයෙන් අදහස් හුවමාරු වන අතර වඩාත් ශක්තිමත් වාණිජ සම්බන්ධතා නිර්මාණය වනවා.

රට පුරා වේළි සහ වාරිමාර්ග වැඩිදියුණු කිරීම සඳහා මූල්‍යකරණය වශයෙන් ඩොලර් මිලියන 70කට ආසන්න ප්‍රමාණයක් ලබාදීම සඳහා මෑතකදී ලෝක බැංකුව සහ ශ්‍රී ලංකාව අතරේ ඇති වූ එකඟතාවය හොඳ ආයෝජනයක් සඳහා උදාහරණයක්. මේ ව්‍යාපෘතිය ගංවතුර, නියගය සහ නායයෑම්වල හානි අඩුකරන අතර ජලයේ ගුණාත්මකබව සහ ගොවීන්ගේ ඵලදාව වැඩිදියුණුකිරීමට හේතු වනු ඇති. ඉන් ග්‍රාමීය පවුල් 356,000කට ප්‍රතිලාභ ලැබෙනු ඇති බව ප්‍රක්ෂේපනය කර තිබෙනවා.

මීට අමතරව එ.ජ. ජාත්‍යන්තර සංවර්ධන මූල්‍ය සංස්ථාව (DFC) පසුගිය මාස හය තුළ ශ්‍රී ලංකාවේ පෞද්ගලික බැංකු වෙත මූල්‍යකරණය වශයෙන් ඩොලර් මිලියන 260කට අධික මුදලක් ලබාදුන් අතර එම මුදල් මෙරට කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්ට රුකුල්දීමටත්, පෞද්ගලික අංශයේ ආයෝජන ශක්තිමත් කිරීමටත්, කාන්තා ව්‍යවසායකයින්ට සහය ලබාදීමටත් යොදාගනිමින් තිබෙනවා. ව්‍යාපාරවල නියුතු කාන්තාවන් සවිබලගැන්වීම හරහා මෙම ගිවිසුම් මූල්‍ය සර්වග්‍රහණය, ස්ත්‍රීපුරුෂ සමාජභාව අසමානතා සම්බන්ධයෙන් කටයුතු කිරීම, සහ කාන්තා නායකත්වය සහිත ව්‍යාපාර සඳහා සහය ලබාදීම වැඩිකිරීම යන අපේ පොදු අරමුණු සමගින් සමපාත වනවා.

අපේ දීර්ඝ කාලීන හවුල්කාරීත්වය මුළුල්ලේ කෘෂිකර්මාන්තයේ සිට අධ්‍යාපනය, සෞඛ්‍යයේ සිට නිවාස, ජලය හා සනීපාරක්ෂාව, පරිසර ආරක්ෂව, යටිතලපහසුකම් පුනරුත්ථාපනය, ක්ෂුද්‍ර ව්‍යාපාරවලට සහයදීම සහ රැකියා කුසලතා පුහුණු යනාදී ශ්‍රී ලංකාවේ සෑම ක්ෂේත්‍රයකටම පාහේ එක්සත් ජනපදයෙන් සහය ලබාදී තිබේ. මේ වනවිට, අප රු. බිලියන 350 ඉක්මවන (ඇ.ඩොලර් මිලියන 2) ආධාර ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට ලබාදී තිබෙනවා. අපේ බොහෝ ව්‍යාපෘති සැලසුම් කරන්නේ අපේ ශ්‍රී ලාංකික විශේෂඥ කාර්යමණ්ඩලය වන අතර තදබල අවශ්‍යතා පවතින්නේ කොහේද සහ ඒවා සපුරාලිය හැක්කේ කෙසේද යන්න තීරණය කිරීමට අප ශ්‍රී ලංකාවේ ජනතාව, පෞද්ගලික අංශය සහ රජය සමග සමීපයෙන් කටයුතු කරනවා. අපේ ආධාරවලින් බහුතරයක් මෙරටට ලැබෙන්නේ ප්‍රදාන වශයෙන් මිස ණය වශයෙන් නොවේ. ශ්‍රී ලාංකික ජනතාවගේ යහපැවැත්ම සඳහා එක්සත් ජනපදයේ කැපවීම මින් පිළිබිඹු වෙනවා.

අප සෑමවිටම ජීවිත නගාසිටුවීමට, ප්‍රජාවන් ගොඩනැංවීමට සහ ස්වයංපෝෂිතබව ඇතිකිරීමට උපකාරී වන ක්‍රම සොයාබලනවා. එසේ කිරීමට, ඇමරිකානු බදුමුදල්වලින් අප වියදම් කරන සෑම ඩොලරයක්ම සැබෑ සංවර්ධන ප්‍රතිඵල සාක්ෂාත් කරගෙන ඇතිබව සහතික කරගැනීමට අප කැපවී සිටිනවා. උදාහරණ වශයෙන් ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එ.ජ. නියෝජිතායතනයේ (USAID) Biz+ ව්‍යාපෘතියෙන් ව්‍යාපාර 60කට වැඩි සංඛ්‍යාවක් ආරම්භ කරන්නට හෝ පුළුල් කරන්නට උපකාර කර තිබෙනවා. මෙතෙක් එම මුලපිරීම හරහා රැකියා 8,000ක් නිර්මාණය කර ව්‍යාපාර ආයෝජන වශයෙන් ඩො. මිලියන 25ක් උත්පාදනය කර තිබෙනවා.

තවත් උදාහරණයක්- වසර කීපයකට පෙර මා දඹුල්ලේ MA's කුළුබඩු නිෂ්පාදනාගාරයට ගියවිට, අප ලබාදෙන උපකාර කාලයත් සමගින් ප්‍රතිලාභ ගෙන දෙන අන්දම දුටුවා. වසර තිහකට පෙර MA's වෙත එක්සත් ජනපදයෙන් අලෙවිකරණ උපදෙස්, තත්ත්ව පාලනය, සහ උපකරණ ලබාදී තිබෙනවා. 2018 දී අපි මධ්‍යම පරිමාණ සමාගමක් බවට වර්ධනය වීම සඳහා MA's වෙත තවත් ශ්‍රී ලංකා රුපියල් මිලියන 57ක් ලබාදී තිබෙනවා. අද මෙම සමාගම දේශීය සහ විදේශීය වෙළඳපල සඳහා නිෂ්පාද 350කට අධික සංඛ්‍යාවක් නිපදවන අතර ශ්‍රී ලාංකිකයින් 400ක් එහි සේවයේ යෙදෙනවා. ගිය මාසයේ ඔවුන්ට එක්සත් ජාතීන්ගේ ආහාර පද්ධති ආයතනයෙන් හොඳම කුඩා ව්‍යාපාර සම්මානයකුත් පිරිනැමුනා.

මේවා, රැකියා නිර්මාණය කරමින් ප්‍රාදේශීය ප්‍රජාවන්ට ආර්ථික ක්‍රියාකාරකම් උත්පාදනය කළ උසස් තත්ත්වයේ ආයෝජන වෙනවා. ශ්‍රී ලාංකිකයින් අපේක්ෂා කරන්නේ එවැනි ආයෝජන කියා සිතනවා.

*5) අතුරුදන්වූවන්ගේ පවුල්වල අය ඔවුන්ගේ විරෝධතා අතරතුර ඇමරිකානු කොඩිය සමගින් සිටිනු දකින්නට ලැබුනා. එය, එක්සත් ජනපදය ගැන ඔවුන්ට ඇති විශ්වාසය පෙන්නුම් කරනවා. කෙසේනමුත්, මානව හිමිකම් සම්බන්ධයෙන් අපේක්ෂිත ප්‍රගතිය මෙතෙක් ළඟා කරගෙන නැතැයි*

*යන අදහසක් දෙමළ ජනතාව අතර පවතිනවා. ඒ අනුව බලන කල, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ගැටළු සම්බන්ධයෙන් එක්සත් ජනපදයේ සම්බන්ධවීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොමැති බවක් උපකල්පනය කළ හැකිද?*

එක්සත් ජනපදය නිදහස් සමාජ සහ මානවහිමිකම් සඳහා සහය දෙනවා, සිවිල් යුද්ධය අතරතුර සහ ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ වෙනත් විවිධ අවස්ථාවල අතුරුදන් වූ අයගේ පවුල්වලට- සෑම ප්‍රජාවකටම අයත් සහ සමාජයේ විවිධ තරාතිරම්වලට අයත් පවුල්වලට- පිළිතුරු ලැබිය යුතු බව අපි විශ්වාස කරනවා. තම ආදරණීයයන් සම්බන්ධයෙන් තවමත් පිළිතුරක් සොයායන පවුල්වල අය හමු වී, බලහත්කාරයෙන් අතුරුදන් කරවීමකින් පසුව දශකයක් හෝ වැඩි කාලයක් එම පුද්ගලයා නොමැතිව ජීවිතයට මුහුණ දුන් අයගේ හඬේ වූ වේදනාවට සවන්දෙන්නට ලැබීම මා ශ්‍රී ලංකාවේ ගත කළ කාලයෙන් සදාකාලිකව මගේ මතකයට කාවැදුනු එක් මතකයක් වනවා. මූලික වශයෙන්, මේ ගැටළු විසඳාගත හැක්කේ ශ්‍රී ලාංකිකයින්ට පමණක් වන අතර ප්‍රතිසන්ධානයත් සර්වග්‍රහණයත් දිරිගැන්වීම කිරීම තමන්ගේම යහපත තකා වැදගත් වන බව ශ්‍රී ලාංකිකයින්ගෙන් බොහෝදෙනෙකුට වැටහෙන බවක් මා සිතනවා. අපට කළ හැකි මානුෂීය කාර්යය එයයි. එසේ අතුරුදන් වී ඇත්තේ ඔබ ආදරය කරන අයෙක් නම්? වසර ගණනාවක් ඔබට පිළිතුරු නොමැතිව සිටින්නට වූයේ නම්?

සැබෑ ප්‍රතිසන්ධානයක් සහ සාමයක් සමාජයේ මුල්බැසගැනීමට නම්, ප්‍රචණ්ඩත්වයෙන් පීඩා විඳි අයට යුක්තිය ලැබීමත් වගවීම සඳහා යන්ත්‍රණයක් තිබීමත් අවශ්‍යයි. මේ අරමුණ කරා ළඟාවීමට UNHRC වැනි යන්ත්‍රණ උදවු කරනවා. තම සියළු ජනතාව කරා වගවන ප්‍රජාතන්ත්‍රවාදී රජයක්, මුල් අවස්ථාවේදී එම ගැටුමට හේතු වූ දේශපාලන, ආර්ථික සහ සමාජ ගැටළු අර්ථවත් අන්දමින් ආමන්ත්‍රණය කිරීමට උත්සාහ දරන අතරේම අවංකව සහ විශ්වසනීය ලෙස අපරාධ චෝදනා විමර්ශනය කර නඩුවිභාග කිරීම සඳහා කැමැත්තෙන් පසුවිය යුතුයි.

එක්සත් ජනපදය ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් සහ නීතියේ ආධිපත්‍ය ආරක්ෂා කරන්නේ අප රටේ මේ සියළු පරමාදර්ශ අප ළඟාකරගෙන ඇති නිසා නොවේ. අප කවදත් උත්සාහ දරන්නේ "වඩාත් පරිපූර්ණ වූ එක්සත්භාවයක්" සඳහා සහ උසස්ම ප්‍රමිතීන් ළඟා කරගැනීමටයි. සමාජයක් වශයෙන් ඒ ආත්ම ආවර්ජනය සහ වර්ධනය ඇතැම් වේලාවට දුෂ්කර සහ වේදනාකාරී විය හැකියි. නමුත්, ප්‍රජාතන්ත්‍රවාද ක්‍රියාත්මක වන්නේ මේ ආකාරයටයි- මක් නිසාද යත්, අවසානයේදී රජයන් පවතින්නේ පාලිතයින් නොහොත් ජනතාවට සේවය කිරීමටත් අපේ සමාජවලට සාමකාමී ලෙස විකාශයවීමට උදවුදීමටත් වන නිසායි.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයේ ආරක්ෂා කර දී ඇති නිදහස ප්‍රවර්ධනය කිරීම සඳහා අපි අපගේ මිතුරන් සහ හවුල්කරුවන් දිරිගන්වනවා. මෙරට ප්‍රතිසන්ධාන වෑයම් සඳහා අපි අඛණ්ඩව සහය ලබාදෙන අතර ප්‍රජාතන්ත්‍රවාදී, සමෘද්ධිමත් සහ සර්වග්‍රාහී ශ්‍රී ලංකාවක් සඳහා අපි කැපවී සිටිනවා.

*6.) ශ්‍රී ලංකාවේ දෙමළ ජනතා ප්‍රශ්නය මූලිකවම දේශපාලන ප්‍රශ්නයක්. දේශපාලන ප්‍රශ්නය විසඳිය හැක්කේ දේශපාලන විසඳුමකින් පමණයි. යුද්ධය අවසාන වී වසර දොළහක් ගතවී ඇතත් මේ ගැටළුව සම්බන්ධයෙන් මූලික සම්මුතියකට ඒම තවමත් සිදුවී නැහැ. ඉන්දු ලංකා ගිවිසුම හරහා පැමිණි 13වැනි සංශෝධනය පවා තවමත් මුළුමනින්ම ක්‍රියාත්මක කර නැහැ. එක්සත් ජනපදය දේශපාලන විසඳුමක් පිළිබඳව උනන්දු බවට දෙමළ දේශපාලන සංවාද කව අතරේ මතයක් තිබෙනවා. ඉන්දියාව මේ සම්බන්ධයෙන් සැලකිල්ල යොමුකළයුතු බව ප්‍රකාශ කර තිබෙනවා. මේ පසුබිම තුළ දෙමළ ජනතාව සඳහා දේශපාලන විසඳුමක් සම්බන්ධයෙන් එක්සත් ජනපදයේ ස්ථාවරය කුමක්ද?*

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රජාවන් සියල්ලෙහිම යහපාලනය, මානව හිමිකම් සහ නීතියේ ආධිපත්‍ය වෙනුවෙන් එක්සත් ජනපදය සහය ලබාදෙනවා- දේශපාලන මට්ටමින් ඒවාට ඇති බාධක සම්බන්ධයෙන් කටයුතු කිරීමත් ඊට ඇතුළත් වනවා. ශ්‍රී ලංකා රජය එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු (SDG) සඳහා කැපවී සිටිනවා. ශ්‍රී ලංකාව මෙම අරමුණු සාක්ෂාත් කරගැනීමේදී, විශේෂයෙන්ම වඩාත් ශක්තිමත් ආයතන සහ සාමකාමී සමාජ සම්බන්ධයෙන් වන SDG #16 සඳහා අපි ශ්‍රී ලංකාවට සහය දෙනවා.

ශ්‍රී ලංකාවේ පාලනය සහ මානව හිමිකම් සඳහා දේශපාලන මාන පවතින බව පිළිගැනීමට ලක් කරමින් දේශපාලන අංශයෙන් ප්‍රගතිය සාක්ෂාත් කරගැනීම සඳහා අපි ශ්‍රී ලංකාව දිරිමත් කරනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අපි සහය දෙන අතර පළාත්සභා මැතිවරණ පැවැත්වීමට අපි රජය දිරිගන්වනවා. තවදුරටත් කළහැකි කාර්යයන් ද තිබෙනවා, ශ්‍රී ලංකා රාජ්‍යය තුළ කලාපීය සහ ප්‍රාදේශීය සවිබලගැන්වීම සහතික කෙරෙන වෙනස්කම් දේශපාලන පද්ධතියට සහ ක්‍රියාවලියට සිදුකිරීමට කාලයක් තිස්සේ බොහෝ වෑයම් දරා ඇති බව මා දන්නවා. එවැනි වෙනස්කම් කිරීම පිළිබඳ තීරණය කළයුත්තේ ශ්‍රී ලාංකීය ජනතාව වන අතර, ජනවාර්ගික ගැටුමේ මූල හේතු ආමන්ත්‍රණය කිරීම සඳහා අනෙකුත් දෑ සිදුකිරීම මෙන්ම දේශපාලන විසඳුමක් ද අවශ්‍ය කරන බව එක්සත් ජනපදයේ විශ්වාසයයි.

ඒ අතරතුර, අවධානය සහ ප්‍රමාණවත් සම්පත් යෙදවීම සමගින්, බිම් මට්ටමේ ජනතාවට තමන් අතර ඇති වෙනස්කම් විසඳාගැනීමට ක්‍රම සොයාගත හැකි බවත් අපි දන්නවා. පක්ෂවාදී නොවන ආකාරයෙන් අපි බිම් මට්ටමේ දේශපාලන ක්‍රියාකාරකම් සඳහා දීර්ඝ කාලයක් තිස්සේ උදවු කර තිබෙනවා. උදාහරණ වශයෙන් ත්‍රිකුණාමලය ආසන්නයේ ඇළ මාර්ගයක් නොසලකා හැර දමා තිබුණා. ඒ අසළ වාසය කළ දෙමළ සහ සිංහල ජනතාව අතරේ ගැටුම් ඇතිවෙන්නට මේ ඇළ මාර්ගය හේතුවෙමින් තිබුණා. මෙම ඇළ මාර්ගය අළුත්වැඩියා කරන්නට එක්සත් ජනපදයෙන් කුඩා ප්‍රදානයක් ලබාදුන්නා. දැන් එම ඇළ කළමනාකරණය කරන්නේ බහු වාර්ගික ගොවි සංගමයකින්, හැමදෙනාටම ඇළේ ජලය වාරි කටයුතු සඳහා භාවිතා කරන්නටත් ගංවතුර අඩුවීමේ වාසි හැමදෙනාටම භුක්ති විඳින්නටත් ඉන් ඉඩ සැලසී තිබෙනවා. මූලික වශයෙන් යටිතලපහසුකම් සම්බන්ධයෙන් වූ එම ප්‍රශ්නය ආමන්ත්‍රණය කිරීම මගින්, ගැටීමට යොමුවී සිටි කණ්ඩායම් දෙකක් වඩාත් හිතවත් තත්වයකට ගෙන එන්නට හැකි වී තිබෙනවා.

*7.) ඇෆ්ගනිස්ථානය තලේබාන් පාලනයක් වෙත ආපසුයෑම ජාත්‍යන්තර ඉස්ලාමික ත්‍රස්තවාදී කණ්ඩායම්වලට ඔක්සිජන් සපයාදීමක් යැයි බොහොදෙනා පෙන්වා දෙනවා. එය නැවතත් ජිහාද්වරුන්ට රැකවරණ ලබාදෙන ස්ථානයක් වේයැයි ඇතැම් අය අනතුරු අඟවනවා. මේ තත්වය තුළ ශ්‍රී ලංකාව හා මාලදිවයින වැනි රටවල් බලපෑමට ලක්විය හැකිද? ශ්‍රී ලංකාව ද ඉස්ලාමික ත්‍රස්තවාදයෙන් පීඩාවට පත්වූ රටක් වනවා.*

ශ්‍රී ලාංකික ජනතාව හොඳින්ම දන්නා පරිදි ත්‍රස්තවාදය කියන්නේ ගෝලීය ප්‍රශ්නයක්. "මෙය අළුත් ලෝකයක්. ත්‍රස්ත තර්ජනය ...ඇෆ්ගනිස්තානයෙන් ඔබ්බට පැතිරී තිබෙනවා. සෝමාලියාවේ අල් ෂබාබ් කණ්ඩායමෙන්, සිරියාවේ හා අරාබි අර්ධද්වීපයේ අල් කයිදා අනුබද්ධ කණ්ඩායම්වලින්, සහ සිරියාවේ හා ඉරාකයේ කැලිෆේටයක් නිර්මාණය කරගැනීමට උත්සාහ දරමින් සහ අප්‍රිකාව හා ආසියාවේ අනුබද්ධිත කණ්ඩායම් ඇතිකරගනිමින් සිටින අයිසිස් මගින් අපි තර්ජනවලට මුහුණ දී සිටිනවා" යැයි බයිඩන් ජනාධිපතිතුමා මෑතකදී සඳහන් කළා.

විසඳුම් කෙරෙහි සහ ඇතිවිය හැකි තර්ජනවල හානි අඩුකරගැනීමට එක්වී වැඩකළහැකි ආකාර ගැන අපේ අවධානය යොමුකිරීම වැදගත් කියා මා සිතනවා. නීතිය ක්‍රියාත්මක කිරීමේ සහයෝගීතාවය සම්බන්ධයෙන් සහ සමුද්‍ර ආරක්ෂාව සම්බන්ධයෙන් අපි එක්වී වැඩ කළ යුතුයි. ශ්‍රී ලංකාව ඇතුළු අපේ සියළුම හවුල්කරුවන් බුද්ධි තොරතුරු සහ තොරතුරු හුවමාරු කරගැනීමට අපි දිරිගන්වනවා. ඊට අමතරව මේ ත්‍රස්ත කණ්ඩායම්වලට මුදල් ලැබෙන්නේ නීතිවිරෝධී සංවිධාන, මත්ද්‍රව්‍ය, සහ වෙනත් අපරාධ ක්‍රියා හරහායි. එනිසා දේශසීමා පසුකර යන අපරාධ සම්බන්ධයෙන් ජාත්‍යන්තර සහයෝගීතාවය වැදගත් වනවා.

කෙසේනමුත්, අප සිවිල් නිදහස සහ මානව හිමිකම් උල්ලංඝනය නොකර ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීම වැදගත් වනවා. ගෝලීයවාදයේ එක් වාසියක් වන්නේ රැඩිකල්කරණය වැඩිවන හෝ අහිංසක ජනයාට ප්‍රතිවිපාක විඳින්නට හේතු නොවන අන්දමේ ක්‍රම යොදාගනිමින් තර්ජනවලට එරෙහිව සටන්වදින බව සහතික කරගන්නට උසස් මට්ටමේ යන්ත්‍රණ දැන් අපට තිබෙනවා. මේ අයිතිවාසිකම් සහ නිදහසට ගරු කිරීම මගින්, සහ සියළුම ප්‍රජා සමගින් සාධනීය ලෙස වැඩකිරීම මගින්, අපි ත්‍රස්තවාදය ඇතිවීමට පවතින ඉඩ අඩුකරනවා.